ලංසු දැන්වීම

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සඳහා අවශ්‍ය වන රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම- 2026/2027**

2026/2027 වර්ෂයක කාලයක් සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති පේරාදෙණිය ශික්ෂණ රෝහලට අනුබද්ධ ගලහා ජාතික භික්ෂු මධ්‍යස්ථානයේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම සඳහා අවශ්‍ය වන සේදුම්කාරක හා විෂ බීජ නාශක රසායනික ද්‍රව්‍ය මිළ දී ගැනීම සඳහා **පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ප්‍රාදේශීය** ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

**9. මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලිය යුතුය.**

I. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත යටතේ හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ ආයතනයක් ලෙස පුවත්පත් දැන්වීම පළ වූ දිනට අවම වශයෙන් වර්ෂයකට පෙර ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.

II. පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය (ඒ ඒ රෝහල් /ආයතනය සඳහා වෙන වෙනම ලියාපදිංචි සහතික ඉදිරිපත් කළ යුතුය)

III. වැට් බදු ගෙවන්නේ නම් පූර්වාසන්න තක්සේරු වර්ෂය සඳහා ආයතනය නමින් වැට් බදු/ආදායම් බදු ගෙවා ඇති බව ලිඛිත සාක්ෂි මඟින් තහවුරු කළ යුතුය. (සී/ස සමාගමක් නම් සමාගම නමින් ද, තනි පුද්ගල /හවුල් ව්‍යාපාර ආයතන සියළු හවුල්කරුවන්ගේ නමින් ද, පූර්වාසන්න වර්ෂය සඳහා ආදායම් බදු, වැට් බදු ගෙවා ඇති බවට ලිඛිත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

IV. ලංසුකරු නිෂ්පාදකයකු නොවන්නේ නම් එම නිෂ්පාදකයාගේ වෙළඳ නියෝජිතයකු බවට ලංසුකරු පිළිගන්නා බවට වූ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

V. වරලත් විගණන ආයතනයකින්, ආයතනයේ විගණනය කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශන (පූර්වාසන්න වසර දෙකකින් එක් වර්ෂයකට අදාළව)

VI. GMP (Good Manufacturing Practices) සහතිකය තිබිය යුතුය.

VII. පහත වගුවේ සඳහන් පරිදි ආයතනයට අදාළ වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින්අධ්‍යක්ෂ ශික්ෂණ රෝහල නමට ලියන ලද ලංසු භාර ගැනීම අවසන් වූ දින සිට දින 77 ක කාලයකට වලංගු වන සේ ලබාගත් ලංසු බැඳුම්කරයක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය. **(2026.04.08** දින සිට **2026.06.24** දක්වා වලංගු විය යුතුය).

10. ලංසු අයදුම්පත් 2026.03.24 දින සිට 2026.04.07 දින දක්වා පේරාදෙණිය ශික්ෂණ රෝහලේ වෙබ් අඩවියෙන් (www.peradeniya-hospital.health.gov.lk) භාගත කර ගත හැකිය. ලංසු අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා ආපසු නොගෙවනු ලබන පහත පරිදි ගාස්තුවක් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ, මහජන බැංකුවේ අංක 057100129025207 දරණ රෝහල් ගිණුම වෙත වාණිජ බැංකුවක් මඟින් තැන්පත් කළ යුතු අතර, අදාළ **රෝහලේ ප්‍රසම්පාදන අංකය Reference** හි ඇතුළත් කළ යුතුය. මුදල් තැන්පත් කිරීමට අදාළ ලදුපතෙහි ගණුදෙනුකරුගේ රිසිට්පත (Customer Copy) ලංසුව සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ආයතනය/රෝහල

| අනු අංකය | රෝහලේ නම | ප්‍රසම්පාදන අංකය | බැංකු අයිරා පහසුකම් ලබා ගත යුතු අවම වටිනාකම | ලංසු ඇපකරය (රු.) | ලංසු ලියවිලි ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|
| 01 | ගලහා ජාතික භික්ෂු මධ්‍යස්ථානය | **THP/EL/02/2026** | 60,000.00 | 5,000.00 | 1,000.00 |

11. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි 2026.04.08 දින **පෙ.ව.10.00** ට පෙර ලැබෙන සේ පේරාදෙණිය ශික්ෂණ රෝහල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ පේරාදෙණිය ශික්ෂණ රෝහලේ ගණකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ භාරදීමට කටයුතු කළ යුතුය. ටෙන්ඩර් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2026/2027 වර්ෂයේ ගලහා ජාතික භික්ෂු මධ්‍යස්ථානයේ පිරිසිදු කිරීමේ සේවාව සඳහා අවශ්‍ය වන සේදුම්කාරක හා විෂබීජ නාශක රසායනික ද්‍රව්‍යමිළ දී ගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු සපයා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. ලංසු ලියවිලි පිටපත් 02කින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

13. **2026.04.08** දින **පෙ.ව. 10.00 දක්වා** පේරාදෙණිය ශික්ෂණ රෝහලේදී ලංසු භාරගැනීම සිදු කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු ලියවිලි විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය. වැඩි විස්තර සඳහා 081388001 අමතන්න.

14. පූර්ව ලංසු රැස්වීම 2026.03.27 **දින පෙ.ව 11.00** ට පේරාදෙණිය ශික්ෂණ රෝහලේදි පැවැත්වේ

15. ඉදිරිපත් වන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
ශික්ෂණ රෝහල,
පේරාදෙණිය.